# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවට අනුබද්ධිත කඳාන ජාතික හෙද විදුහලේ පුහුණුව සඳහා හෙද ශිෂ්‍යයන් බඳවා ගැනීම

ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලේ ස්ථිර සේවය සඳහා බඳවා ගැනීම පිණිස, කඳාන පිහිටි ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට අනුබද්ධිත හෙද විදුහලේ පුහුණුව සඳහා පහත අවශ්‍යතා යටතේ සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අ) අධ්‍යාපන සුදුසුකම් :**

I. අ.පො.ස. (උ/පෙ) විභාගය ජීව විද්‍යාව / භෞතික විද්‍යාව (ගණිතය විෂය ධාරාව) හෝ කෘෂිකර්ම විද්‍යාව විෂය ධාරාවෙන් අවම වශයෙන් විෂයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම.

II. සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව ඇතුළු විෂයන් 04 කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා/පෙ) විභාගය සමත්ව තිබීම.

(ඉහත සඳහන් විභාගයන්හි සහතික කළ සහතික පිටපත් සහ සාමාන්‍ය "Z" ලකුණු අගය අයදුම්පත සමග අමුණා එවිය යුතුය)

**ආ) වයස සීමාව සහ පුහුණුවට අදාළ කොන්දේසි**

1. 2026.01.18 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 25 ට නොවැඩි විය යුතුය.
2. උස අඩි 5' ට නොඅඩු විය යුතුය.
3. අවිවාහක විය යුතුය.
4. ශාරීරිකව හා මානසිකව නිරෝගී විය යුතුය.
5. පුහුණුව සාර්ථකව නිමකරන තුරු අවිවාහකව සිටීමට එකඟ විය යුතුය.
6. පිරිමි අයදුම්කරුවන් පමණක් අයදුම් කළ යුතුය.

**ඇ) දීමනා :**

තෝරා ගනු ලබන අයදුම්කරුවන් කඳාන හෙද විද්‍යාලයේ වසර තුනක (03) කාල සීමාවක පුහුණුව ලැබිය යුතු අතර, අභ්‍යාස කාල සීමාව තුළ පහත සඳහන් ගෙවීම් ලබා දෙනු ඇත.

| | | |
|---|---|---|
| පළමු වසර | : | මසකට රු. 41,317/- |
| දෙවන වසර | : | මසකට රු. 43,730/- |
| තෙවන වසර | : | මසකට රු. 46,310/- |

ඉහත ගෙවීම් වලට අමතරව ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල් මණ්ඩලය මගින් අනුමත කරනු ලබන දීමනාද ලබා දෙනු ඇත.

**ඇ) පොදු කොන්දේසි**

01. තෝරාගන්නා අයදුම්කරුවන් පුහුණු කාල සීමාව තුළ කඳාන හෙද විදුහලේ නීති හා රෙගුලාසි වලට බැඳී සිටිය යුතුය.
02. තෙවසරක පුහුණු කාලය සාර්ථක ලෙස නිමාකළ පසු A ශ්‍රේණියේ ස්ථිර හෙද නිලධාරීන් ලෙස ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවට අනුයුක්ත කරනු ලැබේ. ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ ස්ථිර සේවයට අනුයුක්ත කරනු ලබන හෙද නිලධාරීන්ට වෙනත් රෝහල් වලට ස්ථානමාරු නොමැත.
03. තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක විය යුතුය.
04. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව සමග තෙවසරක පුහුණු කාල සීමාව සාර්ථකව නිම කරලීමට හා අවම වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වසර දහයක (10) කාලයක් සේවය කිරීමට එකඟතාවය දක්වමින් ගිවිසුමකට හා බැඳුම්කරයකට එළඹිය යුතුය.
05. තෝරා ගන්නා අයදුම්කරුවන් පුහුණුව ආරම්භ කිරීමට පෙර ඉහත ගිවිසුම්පත හා බැඳුම්කරය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල් මණ්ඩලය වෙත භාර දිය යුතුයි.
06. ඉහත සඳහන් ගිවිසුම්පතෙහි කොන්දේසි කඩ කරනු ලැබුවේ නම් අභ්‍යාසලාභියා විසින් රුපියල් ලක්ෂ තුනක (රු. 300,000/-) ඇපකරය සහ අභ්‍යාසලාභියා වෙනුවෙන් රෝහල් මණ්ඩලය දැරූ සියලු වියදම් ශ්‍රී ජයවර්ධනපුර රෝහල් මණ්ඩලය වෙත ගෙවිය යුතු වන්නේය.
07. පුහුණුව ලබන කාලය තුළ විනය කඩකිරීමක් හෝ ශාරීරික හා මානසික යෝග්‍යතා නොවන බව තහවුරු වුවහොත් පුහුණුව අත්හිටුවීමට සිදුවනු ඇත.
08. ඉල්ලා ඇති නියමිත සුදුසුකම් නොමැති බව හෝ වංචනික තොරතුරු ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත් පුහුණුව අත්හිටුවීමට සිදුවේ.

**අයදුම්කරන පිළිවෙළ**

ඉහත "අ" හි දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් "ඇ" හි සඳහන් කොන්දේසි සමග එකඟ වන්නේ නම් පමණක් 2026.02.02 දිනට පෙර අධ්‍යක්ෂ, ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල, තලපත්පිටිය, නුගේගොඩ යන ලිපිනයට අයදුම්පත් යොමු කළ යුතුය. කවරයේ වම් ඉහළ කෙළවරේ "**ශිෂ්‍ය හෙද නිලධාරීන් සඳහා අයදුම්පත**" යනුවෙන් සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල,**
**තලපත්පිටිය, නුගේගොඩ.**